# නොපසුබට උත්සාහය මගේ සාර්ථකත්වයයි

## නොදර්න් ෆ්ලීට් කෙයා අධිපති විජිත දෙල්ගම

ජීවිත ගමනේ ජයග්‍රහණ ඉබේ පහළවන්නේ නැත . ඒ සඳහා අති මහත් කැපවීමක් හා උත්සාහයක් අවශ්‍ය ය. සිය ජය කණුව කරා ළඟා වන්නට ලේ දහඩිය කඳුළු හෙළිය යුතු ය. මේ ගමන මග මල් අතුල මාවතක් නොවි. අදඅ පට හමුවන්නේ මෙසේ ජීවිතය ජයගත් අප සමග වෙසෙන අපේ හිතවතෙකි. ඒ නොදර්න් ෆ්ලීට් කෙයා ආයතනයේ නිර්මාතෘ විජිත දෙල්ගම මහතායි. සන්නස අද මේ පිටුව විජිත වෙනුවෙන් වෙන් කෙරෙයි.

නොදර්න් ෆ්ලීට් කෙයා ආයතනය වාහන නඩත්තු ක්ෂෙත්‍රයේ මුල්තැන ගත් ආයතනයක්. මේ ගමන් මග පිළිබඳව විජිතගේ කතාවට අපි සවන් දෙමු.

මම පොඩි කාලේ ඉඳන්ම කාර්මික අංශයට දැඩි කැමැත්තක් දක්වූවා. නමුත් අපේ පවුලේ අයගේ මේ සඳහා යොමුවක් තිබුණේ නැහැ. මගේ මව ගුරුවරියක්. මගේ පියා දක්ෂ ආයුර්වේද වෛද්‍යවරයෙක්. නමුත් මම මේ අංශයට යොමු වීම පිලිබඳව ඒ අයගෙ විරුද්ධත්වක් තිබුණේ නැහැ. මම මුලින්ම කිරිඳිවැල මධ්‍ය මහා විද්‍යලයේ අධ්‍යාපනය ලබා පසුව කොළඹ තර්ස්ටන් විද්‍යාලයට ඇතුල් වුණා. එහිදී තාක්ෂණ විද්‍යා පාඩමට වැඩි උනන්දුවක් දක්වූවා. ඒ උනන්දුවම මාව ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයට යොමු කළා.

තර්ස්ටන් විද්‍යාලයේදී උසස් පෙළ හදාරද්දි මම අධ්‍යයනය කළේ ජීව විද්‍යා අංශයෙන්. නමුත් කාර්මික අංශය කෙරෙහි මගේ තිබුණ ආශාව නිසාම මේ මාර්ගය තෝරා ගත්තා.

ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයට මම ඇතුල් වුණේ 1984 දී. අවුරුදු 4ක් මම එහි අධ්‍යාපනය ලැබුවා. මේ ආයතනයේදී අපට කාර්මික ක්ෂෙත්‍රය පිලිබඳව ඉතා ඉහළ අධ්‍යාපනයක් ලැබුණා. අපට එවන් දැනුමක් ලබා දුන් ගුරුවරුන් මේ අවස්ථාවේදී කෘතවේදීත්වයෙන් සිහිපත් කරන්න මම කැමතියි.

මේ අතරේදී මම ඔක්ස්පෑම් ආයතනයේ රැකියාව කළා. මෙහිදී විදේශිකයන් සමග යුද්ධය පවතින මායිම් ගම්මාන වල නොයෙකුත් සේවාවන්හි යෙදෙන්නට මට අවස්ථාව ලැබුණා.

ඉන් පස්සේ කඩවත ගමනාගමන මණ්ඩලයේ සේවය කළා. මේ අතර වාරයේදී අපේ හිතවතෙක් වන ගාමිණී පැළෑඳ "සියනෑ මොටර්ස්" නමින් වාහන අලුත්වැඩියා ආයතනයක් ආරම්භ කළා. ඔහු විදේශයක රැකියාව කර ඒ වන විට තිබුණ නව



තාක්ෂණික අංගෝපාංග ලංකාවට ගෙනැවිත් තිබුණා. මම ඔහු සමග අර්ධකාලීනව වැඩ කළා.

මම 1989 දී ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වුණා. එයත් අපූරු සිදුවීමක්. පුහුණුවෙන් පසු මාස 6 ක් පමණ කාලයක් රැකියාවක නිරතවී ඉන්නා අතරතුරදී ඔස්ට්‍රේලියාවට සංක්‍රමණ ඉල්ලුම් පත්‍රයක් දැම්මා. මගේ ඉල්ලුම්පත අනුමත වී මට මේරටට එන්න අවස්ථාව ලැබුණා. මේ කාලය ඔස්ට්‍රේලියාවේ අධික උද්ධමණය තිබුණ කාලයක්. ඉතා දැඩි රැකියා හිඟයක් තිබුණා. මගේ අනිත් මිත්‍රයන් අහුවෙන ඕනෙම රැකියාවක් කරන්න පෙළඹුනත් මට ඕනෙම වුණේ කාර්මික අංශයේ රැකියාවක්ම හොයා ගන්න. මම ලංකාවෙන් එන විට මගේ ගමන් මල්ලේ වැඩියෙන්ම තිබුණේ කාර්මික ක්ෂෙත්‍රයට අවශ්‍ය වන ආයුධ ආම්පන්න.

මම කැම්බෆීල්ඩ් වල තියෙන ජේ ඇන් ජේ ට්‍රක් රිපෙයාර්ස් ආයතනයේ රැකියාව ලබාගෙන එක දිගට අවුරුදු 6ක් එහි සේවය කළා. එයින් පස්සෙ තවත් ආයතන ගණනාවකම සේවය කරන්න මට අවස්ථාව ලැබුණා. වසර දහයකට පමණ පසු මම සිටි ට්‍රක්ස් ඇන්ඩ් බස් ආයතනයේ රැකියාවක් ලබා ගත්තා. එහි වසර හතරක් සේවය කළා. ඉන්පසුව මගේ දැණුම තවත් වැඩි කරගන්නට මම නැවත බස් කොම්පැණියකට ඇතුල් වුණා. මේ කාලය තුළ බර වාහන වලට අදාල සියලුම ආකාරයේ බලපත්‍ර ලබා ගන්න මට හැකිවුණා. මම දුක් විඳින එකේ උපරිමයෙන් දුක් විඳලා වැඩ කළා.

මේ සියල්ල අතරේ මගේ ආශාව තිබුණේ මගේම ආයතනයක් ආරම්භ කරන්නයි. මේ සඳහා අවශ්‍ය දැනුම පළපුරුද්ද හා බලපත්‍ර මේ වන මම රැස් කරගෙන හිටියා. මගේ අරමුණ කරා යාමේ පළමු පියවර ලෙස මම ස්මෝල් බිස්නස් මැනේජ්මන්ට් කියන පාඨමාලාව හැදෑරුවා. මගේ ආසාව නිසාම ඉන්පස්සෙ ඉතාම සුලුවෙන් ජංගම කාර්මික සේවයක් ආරම්භ කළා. ටික කාලයක් මේක කරලා මම ගොඩනැගිල්ලක් කුළියට අරගෙන 2002 දී නොදර්න් ෆ්ලීට් කෙයා ආයතන ආරම්භ කළා. මම මෙල්බන් උතුරු ප්‍රදේශයේ ජීවත් වන නිසාත් විවිධ වාහන පිළිබඳ මගේ තිබුණ පළපුරුද්ද නිසාත් මේ නම මම යොදා ගත්තා. මම දැඩි කැපවීමකින් ආයතනය දියුණු කරගන්න මහන්සි වුණා.

මේ අවුරුද්දේදී මම මේ නව ගොඩනැගිල් මිලට ගෙන නොදර්න් ෆ්ලීට් කෙයා ආයතනය වඩාත් නවීන තාක්ෂණයට අනුව වැඩි දියුණු කළා. සැම විටම ඔස්ට්‍රේලියාවේ තිබෙන ඕනෑම වාහන නඩත්තු ආයතනයකට නොදෙවෙනි වෙන ආකාරයේ උසස් ප්‍රමිතියක්







ශ්‍රීනාත් මද්දුමගේ

පවත්වාගෙන යන්න මම උත්සාහ කරනවා. මේ ආයතනයට ඇතුල් වෙන ඕනෑම කෙනෙකුට ඒ බව ඇස් දෙකින්ම බලා ගන්න පුලුවන්. අවශ්‍ය නවීණ උපකරණ පමණක් නොවෙයි ආයතනයේ වටපිටාව පවා මනා ලෙස රැක ගන්න මම උත්සාහ කරනවා.

මේ ආයතනයේ දී සියලුම වාහන වල ප්‍රී පර්චෙස් ඉන්ස්පෙක්ෂන් හැන්ඩ් බුක් සර්විස් වොරන්ටි සර්විස් රෝඩ් වර්දි ටෙස්ටින් ගෑස් කන්වර්ෂන් ආදී හැම සේවාවක්ම අපි සපයනවා.

අද වන විට මගේ ආයතනයේ තිලක් ලලිත් රිශාන්ත ලී අබේ ජේම්ස් ඇතුලු පිරිසක් සේවය කරනවා.

මේ සියලු වැඩ කටයුතු මැද්දේ මම කලා කටයුතු වලත් නියැලෙනවා. ඒකට නම් හේතු වෙන්න ඇත්තෙ අපේ අම්මාගෙ අභාෂය. මම කුඩා කාලයේ සිටම නාට්‍ය නැරඹුවා. මම තර්ස්ටන් විද්‍යාලයේ ඉන්දැද්දි හුඟක් ප්‍රවීණයන්ගේ නාට්‍ය පුරුදු පුහුණු වුණේ තර්ස්ටන් විද්‍යාලයේ තමයි. සුභ සහ යස මධුර ජවනිකා ඒකාධිපති නාට්‍ය පුහුණු වෙනවා මට මතකයි. මෙයත් මට විශාල ලෙස බලපෑවා.නාට්‍යයක් බලලා ආවත් මම ගෙදරදි ඒක රඟපානවා. අපේ ගෙදර අය මගේ රඟපෑම් බලා රසවිඳිනවා. දැනුත් මම නාට්‍ය නැරඹීමත් ගීත ඇසීමත් කරගෙන යනවා. ජීවිතයට කලාව සාහිත්‍යය අත්‍යවශ්‍යයි කියන එකයි මගේ පිලිගැනීම. මම කලාවට බොහෝ සේ ගරු කරන අගය කරන කෙනෙක්.

ඒ වගේම මම හැමවිටම මගේ සමාජයට මගෙන් ඉටු විය යුතු සේවය ඉටු කරන්නත් පසුබට වෙන්නෙ නැහැ. මම බොහෝ සමාජ සේවා කටයුතු වල යෙදී ඉන්නෙ ඒ නිසයි.

මගේ ගමනට මගේ බිරිඳගෙන් ලැබුණ සහය විශාලයි. මම විවාහ වුණේ 991 දී. ඇගේ නම ශිරාණි. මට දරුවන් තුන්දෙනෙක් ඉන්නවා. කැරන් - දුව දිල්ශාන් - පුතා කියාරා ශානි - දුව. මට සහෝදරයො දෙන්නෙක් සහ සහෝදරියක් ඉන්නවා. මම පවුලේ බාලයා. මගේ ලොකු අයියා ගුරුවරයෙක්

දෙවෙනි අයියා ගිණුම්කරන ක්ෂෙත්‍රයේ අක්කාත් ගුරුවරියක්. මගේ දෙමාපියන් දෙදෙනාම මේ වන විට ජීවතුන් අතර නැහැ.

අලුතෙන් මේ ක්ෂෙත්‍රයට එන්නට අදහස් කරන අයට මට දෙන්න තියෙන වැදගත්ම උපදෙස තමයි මෙහේ තියන අලුත් දැනුම හැකි තරම් එකතු කරගන්න කියන එක. අපේ අධ්‍යාපනයත් එයට එක්වුණ පළපුරුද්දත් හේතුවෙන් ඕනෙම වැඩකට බය නැතිව අත ගහන්න පුලුවන් ශක්තිය ලැබෙනවා. මට කියන්න තියෙන දේ තමයි තමන් ඉගෙනගත් ක්ෂෙත්‍රයේම ඉස්සරහට යන්න උත්සාහ කරන්න කියන එක. අප වෙනත් ක්ෂෙත්‍ර වල රැකියාවලට ගියාම ඉගෙන ගත් දෙයින් ප්‍රයෝජනයක් නැතිව යනවා නේද?

මගේ ආයනතය හරහා ශ්‍රී ලාංකික සැමට උපරිම සේවයක් ඉටු කරන එක මගේ බලාපොරොත්තුවයි.

ජීවිතය දෙස ආපසු හැරී බලන විට මට ලොකු සතුටක් දැනෙනවා. දැඩි කැපවීමේ ප්‍රතිඵල තමයි අද මං මේ විඳින්නෙ. අනිත් හැම දෙනාටම එය ආදර්ශයක් වේවි කියලා මම හිතනවා.